# අ.පො.ස උසස් පෙළ



# දේශපාලන විද්‍යාව



දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ

## දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ

ක්‍රි.පු. 4 සියවසෙන් ඇරඹෙන දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීයම හැදෑරීම එහි විෂය පථය හා ප්‍රවේශ දිගු කාලයක් විකාශනය වීම හරහා අද වන විට දේශපාලන විද්‍යාව,

i. පුළුල් විෂය පථයකට උරුමකම් කියයි.
ii. විෂය හැදෑරීමට අධ්‍යයන ප්‍රවේශ රැසක් තිබීම.

යන සාධකවලින් යුක්තව විසිවන සියවසේදී ස්වාධීන විෂයක් ලෙස සිය අනන්‍යතාව තහවුරු කරගෙන ඇත.

### විෂය හැදෑරීමේ අධ්‍යයන ක්‍රම

- දාර්ශනික ප්‍රතිමානිය ප්‍රවේශය
- තුලනාත්මක ප්‍රවේශය
- බහු විෂයක ප්‍රවේශය
- විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය
- දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
- සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
- ස්ත්‍රීවාදී ප්‍රවේශය

### දාර්ශනික ප්‍රතිමානිය ප්‍රවේශය

දේශපාලන විද්‍යාවේ දක්නට ලැබෙන ඉතා පැරණි අධ්‍යයන ප්‍රවේශයකි.



The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ප්‍රවේශයේ චින්තකයන් භාණ්ඩ තුනකට වර්ග කල හැකිය.

**පුරෝගාමී චින්තකයන්**

- ප්ලේටෝ
- ඇරිස්ටෝටල්

**සිසරෝ/ ශාන්ත ඔස්ටින්**

- මැකියාවලි / තොමස්හොබ්ස්
- ජොන් ලොක්
- හෙගල්
- කාල් මාක්ස්

**20 වන සියවසේ චින්තකයන්**

- මහත්මා ගාන්ධි
- ජොන් රොල්ස්
- චාල්ස් ටේලර්
- යර්ගන් හබර්මාස්

මෙම චින්තකයන් දර්ශනයෙහි විවධ වෙනස්කම් පැවතියද පොදු කරුණු දෙකක් හදුනාගත හැකිය.

I. මොවුන් දේශපාලන විද්‍යාඥයන් නොව දේශපාලන දාර්ශනිකයන් වීම.
II. ප්‍රතිමානිය දෘෂ්ඨියෙන් දේශපාලනය යන ප්‍රපංචය දෙස බැලීම.

ප්‍රතිමානිය යනු ලෝකයේ සිදුවීම් පිලිබඳව හොඳ/ නරක ,යහපත් අයහපත් ආදී ලෙස වටිනාකම් විනිශ්චය කිරීම.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## දර්ශනවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ

i. දේශපාලනය පිලිබඳ අතිමූලික ප්‍රශ්න නැගීම.
ii. ලෝකය වටහා ගැනීමට භාවිතා කරන සංකල්ප වල අර්ථය නිරවුල් හා නිශ්චය කර ගැනීමට විශේෂ උනන්දුවක් දැක්වීම.
iii. දේශපාලනයෙහි ප්‍රතිමානීය අරමුණු ගැන දක්වන දැඩි උනන්දුව

ලෝකය වඩාත් හොඳ ස්ථානයක් බවට පත් කිරීමට සකස් විය යුත්තේ කෙසේදැයි සිතන්නට අනුබල දෙන්නේ ප්‍රතිමානීය අරමුණුය.

## දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශයේ ලක්ෂණ

i. භාවිතාකරන සංකල්පවල අර්ථ ගැඹුරින් ගවේෂණය කිරීම.
ii. දේශපාලන ලෝකය පිලිබඳ ඇති ගැටළු මතු කරමින් ඒවා විභාග කිරීම.
iii. දේශපාලන චින්තන විග්‍රහයේ ආයතන වල හා භාවිතා වල ප්‍රතිමානීය ලක්ෂණ හා කැපවීම ගැන උනන්දු වීම.


Copyright © e-thaksalawa.moe.gov.lk

## තුලනාත්මක ප්‍රවේශය

### සංසන්දනාත්මක විග්‍රහය මත පදනම් වන අධ්‍යයන ප්‍රවේශය

මෙම ප්‍රවේශය ඉතා වැදගත් කොට සලකන්නේ යම් සමාජ දේශපාලන ප්‍රපංචයක් / ගැටළුවක්/ කණ්ඩායමක් පිලිබඳ පරිපූර්ණ අවබෝධයක් ලබාගැනීමට සංසන්දනාත්මක අධ්‍යයනය වඩා ඵලදායි වීම.

**දේශපාලනය තුලනාත්මකව හැදෑරීමට බලපෑ හේතු**

i. තම රටේ දේශපාලනය අවබෝධ කර ගැනීමට ලොව සෙසු රටවල දේශපාලනය ගැන අවබෝධය වැදගත් වීම.

ii. එක් එක් රටක දේශපාලන ඉතිහාසය, දේශපාලන පසුබිම හා දේශපාලන ආයතන ගැන ලබා ගන්නා සංසන්දනාත්මක අවබෝධයකින් තොරව එම රටවල දේශපාලනය ගැන මනා අවබෝධයක් ලබා ගත නොහැකිවීම.

<u>තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාරා තුනකි.</u>

**I. සම්භාව්‍යය තුලනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය**

පුරාණ ග්‍රීක/ රෝම/ මධ්‍යතන යුරෝපීය දේශපාලන චින්තකයන් විෂය හැදෑරීමට යොදා ගෙන ඇත.
උදා - ඇරිස්ටෝටල් ග්‍රීක පෞර රාජ්‍යය තුලනාත්මකව හැදෑරීම.

**II. 20 වන සියවසේ තුලනාත්මක දේශපාලන අධ්‍යයනය**

ස්වාභාවික විද්‍යාවන් හැදෑරීමට යොදා ගන්නා විධි ක්‍රම යොදාගෙන විෂය අධ්‍යයනය සිදු කල යුතු බව ප්‍රකාශ කරන අධ්‍යයන ප්‍රවේශය මෙම චින්තකයන් ප්‍රකාශ කරන්නේ දේශපාලන විද්‍යා අධ්‍යයන විධික්‍රම ස්වභාවික විද්‍යා විධි ක්‍රමයට අනුරූප ආනුභාවිත විද්‍යාවක් විය යුතු බවයි. මොවුන් ප්‍රකාශ කරන්නේ තුලනාත්මක දේශපාලනයේ විෂය මාතෘකා විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හෝ දේශපාලන ඉතිහාසය සැසදීම නොව ආනුභූවිකව නිර්මාණය කල හැකි වර්තමාන දේශපාලන තේමාවන් පදනම් කර ගැනීම බවය.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**III. සමකාලීන තුලනාත්මක දේශපාලන අධ්‍යයනය**

i. පහත සඳහන් බෙහෙවින් නම්‍යශීලී විෂයපථ හැදෑරීම සිදු කරයි.

උදා -

- දේශපාලන ආයතන/ දේශපාලන ක්‍රියාවලි
- දේශපාලන පරිවර්ථන / සමාජ දේශපාලන ගැටුම් හා සාම ක්‍රියාවලි
- රාජ්‍යයේ ස්වභාවය හා පරිවර්තන
- ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයේ දිශානති
- පුරවැසි ක්‍රියාකාරීත්වය / ජාතිකවාදී දේශපාලනය
- සිවිල් සමාජ දේශපාලන ක්‍රියාකාරීත්වය
- මානව අයිතිවාසිකම් / ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගීත්වය

ii. තුලනාත්මක දේශපාලන විග්‍රහයට සුසමාදර්ශී මාදිලි අවශ්‍ය නැති බව

iii. තුලනාත්මක දේශපාලන විග්‍රහයේ අරමුණ විය යුත්තේ එක් එක් රටවල දේශපාලන යථාර්ථයන් වෙතින් තුලනාත්මක දැනුම උකහා ගෙන දේශපාලන විග්‍රහය ශක්තිමත් කිරීම.

**බහු විෂයක ප්‍රවේශය**

දේශපාලන විද්‍යාවට පරිබාහිර විෂයන්ගේ න්‍යාය / සංකල්ප හා විධි ක්‍රම යොදා ගෙන දේශපාලන විද්‍යාව අධ්‍යයනය කල හැකි බව ප්‍රකාශ කරන අධ්‍යයන ප්‍රවේශය මෙහිදි ඔවුන් ප්‍රකාශ කරන්නේ ඉතිහාසය පුරාම දේශපාලන විද්‍යාව සැම විටම සෙසු විෂයන් හා සම්බන්ධ වී පෝෂණය ලබා ඇති බවය.

**ග්‍රීක යුගය - දර්ශනවාදය ඉතිහාසය**

**රෝම යුගය - දේව ධර්ම ශාස්ත්‍රය / ඉතිහාසය / නීති විද්‍යාව**

**19 වන සියවස - අර්ථ ශාස්ත්‍රය / ඉතිහාසය / නීති විද්‍යාව**

**20 වන සියවස - සමාජ විද්‍යාව / මානව විද්‍යාව / මනෝ විද්‍යාව/ භූගෝලය**



The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

### දේශපාලන විද්‍යාවට බහුවිෂයක ප්‍රවේශය අවශ්‍ය වීමට හේතු

i. දේශපාලනය සමාජයේ සෙසු පැතිකඩවලින් හුදකලා වී වියුක්තව පවතින්නක් නොව සෙසු විෂය පැතිකඩ සමග බද්ධව පැවතීම.
ii. ස්වාධීන විෂයක් ලෙස තහවුරු වුවද අඩු / වැඩි වශයෙන් දේශපාලනය සෙසු විෂය පැතිකඩ සමග බද්ධව පැවතීම.

### දේශපාලනය හා ඉතිහාසය අතර සම්බන්ධය

ඉතිහාසය යනු අතීත දේශපාලනයයි.දේශපාලනය යනු වර්තමාන ඉතිහාසයයි.

දේශපාලන විද්‍යාව නොමැති ඉතිහාසයෙන් පලක් නැත. ඉතිහාසය නොමැති දේශපාලන විද්‍යාවේ මූලයන් නොමැත. මේ අනුව ඉතිහාසය හා දේශපාලන විද්‍යාව අතර අඛන්ඩ සම්බන්ධයක් පවතී.

### ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව

නූතන දේශපාලන හා ආර්ථික විද්‍යාඥයන් යන පාර්ශ්ව දෙකම යහපත් සමාජයක් නිර්මාණය කිරීම සඳහා එකම දිශාවකට ගමන් කරයි.

### දර්ශනය හා දේශපාලන විද්‍යාව

ග්‍රීක යුගයේ ප්ලේටෝ / ඇරිස්ටෝටල්ගේ සිටම දේශපාලන විද්‍යාවේ විෂය කරුණුවලින් වැඩිම ප්‍රමාණයක් දාර්ශනික කරුණු මත පදනම් වීම තුල දේශපාලන විද්‍යාවේ දේශපාලන දර්ශනය නමින් විෂය ක්ෂේත්‍ර කොටසක් පවතී.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය

1930/ 40 දශකවල ඇමරිකානු දේශපාලන චින්තකයන් අතර ඉතා ප්‍රබල ලෙස පැතිරී ගිය මතවාදයක් වූයේ දේශපාලන විද්‍යාව සැබෑ නිර්ව්‍යාජ විද්‍යා විෂයක් බවට පත් කිරීමට නම් ස්වභාවික විද්‍යාවන් හා ආර්ථික විද්‍යාව මනෝ විද්‍යාව භාවිතා කරන විද්‍යාත්මක ශිල්ප ක්‍රම හා විධික්‍රම යොදා ගත යුතු බවයි. එනම් විද්‍යාත්මක හා ආනුභාවික විධික්‍රම විෂය හැදෑරීමට යොදාගත යුතු බවයි.

## විද්‍යාත්මක ප්‍රවේශයේ මූලධර්ම

i. සමාජ දේශපාලන අධ්‍යයනයන්ගේ මූලික ඉලක්කය විය යුත්තේ ආනුභාවික පර්යේෂණ හරහා ලබා ගන්නා කරුණු / සාක්ෂි / දත්ත මත පදනම් වූ දැනුමක් නිෂ්පාදනය කිරීමය.
ii. විද්‍යාත්මකව ගොඩනගන සමාජ හා දේශපාලන විග්‍රහයක් වාස්තවික විය යුතුය.
iii. අගය කිරීම් වලින් තොර වීම.

## විද්‍යාත්මක ප්‍රවේශය හා චර්යාවාදය

ඉහත දැක්වූ විද්‍යාත්මක ප්‍රවේශය මත පදනම්ව දේශපාලනය හැදෑරීම සිදු කරන අධ්‍යයන ප්‍රවේශය චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශයයි. 1920 දශකයේ ඇරඹී 1930/ 40 දශකවල පුළුල් වී දේශපාලන විද්‍යාවේ අධිපතිවාදී මතවාදයක් බවට පත් වීම තුල පසුකාලීන ග්‍රන්ථ වල එම තත්වය හැදින්වූයේ චර්යාවාදී විප්ලවය ලෙසය.


Copyright © e-thaksalawa.moe.gov.lk

## චර්යාවාදී අධ්‍යාපනයේ ලක්ෂණ

i. ආනුභාවිකව අධ්‍යයනය කල හැකි දේශපාලන ප්‍රපංච පිළිබඳව හැදෑරිය යුතු වීම.
ii. පුද්ගල දේශපාලන චර්යාව හැදෑරීම මූලික වීම.
iii. පුද්ගල චර්යාව පිලිබඳ ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම.

1930/40 දශකයේ අධිපතිවාදී විෂයධාරාවක් බවට පත් වී 1970/40 දශකයේ පසුබැමට ලක්වීමේදී දේශපාලනයේ එක් පැතිකඩක් පමණක් හැදෑරීම හරහා විෂය පටු කර ඇති බව චෝදනා එල්ල විය. එමෙන්ම දාර්ශනික / ඓතිහාසික/ සමාජ විද්‍යාවත් අධිපතිවාදී බව බිඳවැටීම හේතුවන අතර එහි අවසානප්‍රතිඵලය වූයේ 1970 දශකයේ පශ්චාත් චර්යාවාදී අවධියට ප්‍රවිශ්ය වන අතරම අනුභවික හා ප්‍රත්‍යක්ෂ මූලවාදී ගුරුකුලයේ ආධිපත්‍යද බිඳ වැටෙන්නට වීමද දක්නට විය. මෙම වෙනසට මාක්සිවාදී - නව මාක්ස්වාදී ලිබරල් දාර්ශනික ස්ත්‍රීවාදී හා පශ්චාත් නූතනවාදී ධාරා වෙතින් එල්ල වූ අභියෝගයද බලපෑවේය.

## චර්යාවාදයේ මෑත කාලීන ප්‍රවණතාවය

**පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම**

## දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

කාල පරිච්ඡේද දෙකක් යටතේ විග්‍රහ කළ හැකිය.

i. මුල් යුගය

චින්තකයන් - 18 වන සියවසේ යුරෝපා චින්තකයන් ඇඩම් ස්මිත් , ඩේවිඩ් රිකාඩෝ , ජෝන් ස්ටුවඩ් මිල් , තෝමස් මැල්තස්


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

භාණ්ඩ නිෂ්පාදනය වෙළඳාම හා ජාතික ආදායම යන ආර්ථික ක්‍රියාවලිය පහත සාධක වලට කරන බලපෑම අධ්‍යයනය කළේය .

1) ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමග සම්බන්ධ වන ආකාරය
2) ආර්ථික ක්‍රියාවලියට ආණ්ඩුවේ ප්‍රතිපත්ති වල බලපෑම

### ii. නූතන යුගය

මුළුමනින්ම කාල් මාක්ස්ගේ මාක්ස්වාදී න්‍යාය හා ප්‍රවේශ මත පදනම්ව ඇත.

### මාක්ස්ගේ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ ලක්ෂණ

1) ආර්ථික ක්ෂේත්‍රය පිළිබඳව ගැඹුරු හැදෑරීමක් සිදු කිරීම.
2) ඓතිහාසික භෞතිකවාදය නමින් නව න්‍යායික පද්ධතියක් ගොඩනැගීම.

### ඓතිහාසික භෞතිකවාදයේ න්‍යායික ලක්ෂණ

- මුළු සමාජයම සමස්තයක් ලෙස ගෙන ක්‍රියා කිරීම.
- සමාජ පැවැත්ම උපරි ව්‍යුහය හා අන්තර් ව්‍යුහය ලෙස තල දෙකකට බෙදීම.
- උපරි ව්‍යුහයේ අංග අන්තර් ව්‍යුහයේ පවත්නා නිශ්පාදන ක්‍රමයට වාසිදායක ලෙස හැසිරීම.
- අන්තර් ව්‍යුහය වෙනස් කළ විට උපරි ව්‍යුහයේ අංගද වෙනස් වීම.
- ආර්ථික සමාජ හා දේශපාලන පරිවර්තනයන්ගේ මූලික සාධකය ලෙස ඕනෑම සමාජයක සමාජ පංති අරගලයයි.
- මාක්ස්වාදය මත පදනම් වූ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය දේශපාලන විද්‍යාවට එකතු වන්නේ චර්යාවාදී ප්‍රවේශයට විකල්ප ප්‍රවේශයක් ලෙසය.


Copyright © e-thaksalawa.moe.gov.lk

## අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ පැතිකඩ

- දේශපාලන ප්‍රපංච විග්‍රහ කිරීමේදි එම සාධකවල ආර්ථික හා සමාජ පංති මූලයන්ද හදුනාගෙන එම සමාජය ආශ්‍රිතව නව විග්‍රහයක් ගොඩනැගීම.
- ආර්ථික හා සමාජ පංති යන සාධක මත දේශපාලනය තීරණය වන බවදේශපාලනයේ ඇති අතිමූලික තේමාවන් ලෙස පංති විභේදනය / පංති ගැටුම / රාජ්‍යය / ආධිපත්‍ය විරෝධතා / සමාජ ප්‍රතිචාර.
- දේශපාලන අධ්‍යයනයේදී සමාජ / දේශපාලන / ආර්ථික මතවාදී ක්ෂේත්‍රවල දක්නට ලැබෙන ආධිපත්‍යධාරි බල ව්‍යුහයන් රැඩිකල් විවේචනයට ලක් කිරීම ඉලක්ක කර ගැනීම.

## සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

ආරම්භක යුගයේ සිටම දේශපාලන විද්‍යාව හා සෙසු සමාජ විද්‍යාවන් අතර සමීපසම්බන්ධයක් පැවැති අතර 20 සියවසේ ස්වාධීන විෂයක් ලෙස සිය අනන්‍යතාවය තහවුරු කරගත් පසුද , අදටත් සමාජ විද්‍යා විෂයන් සමග සමීප ශාස්ත්‍රීය සබදතාවක් පැවතීමේ ප්‍රතිඵලය ලෙස විෂය කාණ්ඩ දෙකටම පොදු දේශපාලන සමාජ විද්‍යාව උප ක්ෂේත්‍රය නිර්මාණය වී ඇත.

මේ අනුව දේශපාලන විද්‍යාව අධයනය හා විග්‍රහයට සමාජ විද්‍යාවන්ගේ න්‍යාය / ප්‍රවේශ හා විධි ක්‍රම බෙහෙවින් ප්‍රයෝජනයට ගනී.

සමාජ විද්‍යා ප්‍රවේශයේ චින්තකයින් ඛාණ්ඩ දෙකකට වර්ග කළ හැකිය.

**1) 20 වන සියවසට පෙර**

ඔගස්ත් කොම්ත් , කාල්මාක්ස් , මැක්ස් වේබර්

**2) 20 සියවස මැද**

ෆැන්ක්ෆර්ට් ගුරුකුලය

දේශපාලන විද්‍යාවට සමාජ විද්‍යාවන් හා මානව විද්‍යාවන්ගෙන් ලැබී ඇති ආභාෂය දේශපාලන විද්‍යාවේ විධික්‍රම හා න්‍යායික පරිමාව යන අංශ දෙකෙහිම දැකගත හැකිය.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

දේශපාලන විද්‍යාවේ අධ්‍යයනය කරන සමහර ගැටළු හා තේමා පිළිබඳව සමාජය ආශ්‍රිතව පුළුල් හා ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට සමාජ විද්‍යා හා මානව විද්‍යා ප්‍රවේශ ඉතා වැදගත්ය.

## ස්ත්‍රීවාදී ප්‍රවේශය

දේශපාලන හා සමාජ අධ්‍යානයට විශාල බලපෑමක් කළ ස්ත්‍රීවාදය 1970 දශකයේ ශාස්ත්‍රීය ධාරාවක් බවට පත්වේ.

### විශේෂ ලක්ෂණ

- දේශපාලනයෙහි අතිමූලික ප්‍රශ්න විමර්ශනය.
- දේශපාලනය යන සංකල්පයේ අර්ථය සංවර්ධනය කිරීම.
- දේශපාලනයෙහි සාම්ප්‍රදායික ගැටළු වලට වඩා වෙනස් ප්‍රශ්න මතු කිරීම.
- දේශපාලනය යන ක්ෂේත්‍රයේ ස්ත්‍රීන් බැහැර කර ඇත්තේ ඇයි?
- ස්ත්‍රීන් පීඩනයට පත් කරන සමාජ දේශපාලන සංස්කෘතික මතවාද මොනවාද?
- දේශපාලන හා සමාජ විග්‍රහයට නව න්‍යායික සංකල්ප ගණනාවක් එකතු කරයි.

උදා - ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනනය

ස්ත්‍රී පීඩනය

පුරුෂ කේන්ද්‍රීයත්වය

ස්ත්‍රී විමුක්තිය

දේශපාලන විද්‍යා විමර්ශනය හා න්‍යාය ස්ත්‍රීවාදී ප්‍රවේශය හරහා පහත ආකාරයට දැක්විය හැකිය.

- දේශපාලන විද්‍යාවේ අතිමූලික සංකල්ප සියල්ලම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආශ්‍රයෙන් යළි විමර්ශනය කිරීම.
- දේශපාලන විද්‍යාවේ අතිමූලික ගැටළු අතරට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රවේශය එකතු කිරීම.
- දේශපාලන විද්‍යාවේ ඇති මූලික අනන්‍යතා සංකල්ප අතරට ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන්න එකතු කිරීම
- මනුෂ්‍ය හා සමාජ විමුක්තිය පිළිබඳව ඇති සම්ප්‍රදායික මූලික දර්ශන අතරට ස්ත්‍රී විමුක්තිය ඇතුළත් කිරීම.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk